## කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

**බාහිර විභාග අංශය**

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2009**

**2010 අගෝස්තු / සැප්තැම්බර්**

**මානවශාස්ත්‍ර පීඨය**

**සිංහල - SINH -E3025**

**භාෂා පරිණාමය, පුරාක්ෂර විද්‍යාව හා කලාශිල්ප**

**<u>පළමුවන ප්‍රශ්නය ද දෙවන හා තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් ද තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.</u>**

**ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි** **කාලය : පැය 03 යි**

---

## I කොටස

01. පහත සඳහන් පාඨයන්හි අදහස ලිහිල් බසින් ලියන්න.

(පළමු ප්‍රශ්නයට පැයක පමණ කාලයක් සෑහේ.)

I

බඩකරි(ක-පරු)මක තිශ පුත බඩකරික පරුමක මගහ
ලෙණ ශගශ

ගමික උදයහ ඝඩය උපශික තිශය ලෙණෙ ශගශ

ගුත පුතහ පරුමක පුරහ ලෙණෙ අගතගත චතුදිශ
ශගශ

දෙවනපිය මහරඣ ගමිණි අබයශ පුත ලොණපි අය
ශිවශ ලෙණෙ ශගශ

ගමණි උති මහරඣ (ඣිත අබි ති)ශය ලෙණෙ දශ දිශශ
සගශය

මතපිගශ අටය

පරුමක පොතිමගශහ පුත උතිය ච ශොමදෙවහ ච
අගත අනගත ශගශ **(ලකුණු 10 යි)**

II

මඟුල් සිහසුන් රක් ගල් තල අරය් වජන් බෙරසීනය්නෙන් රුපු
වරණන් ඇඩි මඳ සින්දු සී පැරැක්මෙන්

වැජැම්බැ අනත් අපිරිසෙය් සොම් නිමල ගුණ වතුරෙන් ජියල්
සනහය් සසුන් අරියූ ලක්දිව් පොළොව් මෙහෙ-

සත පරපුරෙන් හිමි මපුරුම් **බුද්දස් සිරිසඟ්බොයි** අබහය්
මහරජ්හට් ජා සඟ් බඩය අප බිසෙව්

රැජ්නැණියන් කුස්හි හෙවැ දුනු සැණැහි මෙ යුවරජ් බිසෙව්
සිරි පැමැණැ යස තෙජ් හිර් සන්දනෙන් ලොව් පහ-

යය් සිය වික්මෙන් සතුරන් මැඬැ පළ නිමල කිත් වතුරෙන්
ලොවත් පතුල් දෙබිසෙවැ ජා **සලමෙය්වන් අබ-
යහ්** මහරජ්යුතාර්

තුමන් සත්ලැගු සවන හවුරුදුයෙහි **අභයග්රි වෙහෙර
කපාරාමූළට්** සලමෙය්වන් පවු කරය් සඟුන්

වසවය් සතර පස සුලබ්කොට් මෙමෙ නකය් අබදි අවසට් මෙ
සිරිත් තැබැවූහු **(ලකුණු 10 යි)**

III

1. ලී දඩට ස්වාමි ගිනු-
2. -ත් මිසැ අබුදරු
3. වන් වැලැක්මෙ නො
4. ගන්නා ඉසා (1*) ගම-
5. -ට් ආ රදොලන් රහ
6. මස් දිහි තෙල් නො
7. ගන්නා ඉසා (1*) වතු-
8. පෙත් වෙත් වැදූ රහ
9. නොගන්නා ඉසා (1*)
10. සොරවෙළඳම් නො
11. කරනු ඉසා (1*) පොහො-
12. දා සල් කළාකුගෙ-
13. -න් වැපුදයට් තෙ-
14. -ල් පද්දක් ගන්නා
15. ඉසා (1*) මියුගුණ් ම-
16. -හවෙහෙර වැපුද
17. පවත්වනු ඉසා (1*) වැ -
18. පුදයට නොලැබුණා-
19. -කුගෙන් පෙරෙ සිරිත්
20. දඩ වැපුදයට් (ග)
21. ගන්නා ඉසා (1*) බ-
22. -ඩු ගෙනැ ගම් වන්
23. ගොණිගොන් නො ග-
24. -න්නා ඉසා (1*)

**(ලකුණු 10 යි)**

IV අත්පාටහලට් ගියාකුගෙන් දඩ පතාස් කළ
නැක් රන් ගන්නා කොට් ඉසා නො පොහොත් (ගෙ) දඩ ගන්නා
කොට් ඉසා ගෙදැඩි නැත අත් කපා පට්වනු කොට් ඉසා
වූ දඩ සිහින් දඩ පෙරෙ සිරිත්සෙ ගම්ලද්දන් පමුණු
(ලද්දන් බෙදා) ගන්නා කොට් ඉසා මීවුන් ගෙරිගොන් එළු
වන් මැරුවන් මරා පට්වනු කොට් ඉසා නොමරා සොරා
ගෙනැ ගිය නියත කොට් ඔවුන් ඔවුන් කසිලැ සන්ල
කුණ් ඔබා හර්නා කොට් ඉසා තිරැ නො වත් කොටා පට්ව
නු කොට් ඉසා බැහැරින් ඇරැ විකුණන මීවුන් ගෙරි
ගොන් එළුවන් හැන්දිනැ ඇපැ ගෙනැ ගන්නා කොට් ඉසා

(ලකුණු 10 යි)

හෝ

පහත සඳහන් ශිලාලිපි කියවා වර්තමාන අකුරින් ලියන්න.



## II කොටස

(ලකුණු 10 යි)

02. සිංහල ශබ්ද කෝෂකරුවන්ගේ යුග වර්ගීකරණය හඳුන්වා සිංහල ප්‍රාකෘත යුගයේ අක්ෂර මාලාව ද නිශ්‍රය කරමින් තද් යුගයේ භාෂා ලක්ෂණ නිදසුන් සහිත ව පහදන්න.
(ලකුණු 15 යි)

03. සංක්‍රාන්ති භාෂා යුගයක් ලෙස මධ්‍යතන සිංහල අවධියේ භාෂාවේ සංකීර්ණතාව පිළිබඳ කෙටි සමාලෝචනයක් කොට එම යුගයේ ශිලාලිපිවලින් ප්‍රකට කරන සිංහල භාෂා ස්වරූපය පහදන්න. (ලකුණු 15 යි)

04. 'ක්‍රි. ව. 10 වන සියවසේ ලංකාවේ ක්‍රියාත්මක වාණිජ නීතිය පිළිබඳ අධ්‍යයනයක දී බදුලු ටැම් ලිපිය ප්‍රශස්ත මූලාශ්‍රයක් වෙයි.' විමසන්න. (ලකුණු 15 යි)

05. පහත සඳහන් මාතෘකාවලින් <u>දෙකක් (02)</u> පිළිබඳ කෙටි සටහන් ලියන්න.
   I. අශෝක බ්‍රාහ්මී අක්ෂර මාලාවේ රූපීය ස්වභාවය
   II. සිංහලයෙහි අනාර්‍ය භාෂා ලක්ෂණ
   III. සිංහල අක්ෂර විෂයෙහි ආන්ධ්‍ර හෝ පල්ලව ආභාසය
   IV. සිංහලය කෙරෙහි අපරදිග භාෂාවල බලපෑම (ලකුණු 15 යි)

## III කොටස

06. ශ්‍රී ලංකාවේ ප්‍රාග් බෞද්ධ කලා ශිල්පීය සාධක පිළිබඳ සමාලෝචනයක් කරන්න.
(ලකුණු 15 යි)

07. බුදුපිළිමයේ ප්‍රභවය සම්බන්ධයෙන් පවත්නා මතවාද කවරේද' යි සාකච්ඡා කරන්න.
(ලකුණු 15 යි)

08. වස්තු විෂය හා භාවිත ශිල්ප ක්‍රම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් සීගිරි චිත්‍ර පිළිබඳ ඇගයීමක් කරන්න. (ලකුණු 15 යි)

09. පහත සඳහන් මාතෘකා අතරින් <u>දෙකක් (02)</u> පිළිබඳ සටහන් ලියන්න.
   I. සඳකඩපහණ
   II. චෛත්‍යඝර
   III. පොළොන්නරු යුගයේ කලා ශිල්පවල ද්‍රවිඩ ආභාසය
   IV. කැලණි විහාරයේ චිත්‍ර (ලකුණු 15 යි)